## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

## ජනාධිපතිවරණය - 2024

## පොලිස් නිලධාරීන් සඳහා වූ මාර්ගෝපදේශ

ශ්‍රී ලංකාවට අදාළ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුව හා 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව ජනතාව සතු ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතියත්, දේශපාලන කටයුතු වල නිදහසේ නිරත වීමේ අයිතියත්, නිදහස් හා සාධාරණ මැතිවරණයකට ඇති අයිතියත් තහවුරු කර ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව අවධානයට ගනී. ඡන්දය කාලසීමාවේදී හා ඡන්දය පැවැත්වෙන දිනයේදීත්, ඡන්දය අවසන් වූ කාලසීමාවේදීත් පහත සඳහන් මාර්ගෝපදේශයන් සියලුම පොලිස් නිලධාරීන් විසින් පිළිපැදිය යුතු වේ.

(අ) මැතිවරණ කාලසීමාවේදී, මැතිවරණ දිනයේ හා ඉන් පසු සිදුවන මැතිවරණ හිංසනයන් පිළිබද පැමිණිලි භාර ගැනීමත්, විමර්ශනය කිරීමත් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝණය නොවන සේ කළ යුතුය. එම ව්‍යවස්ථාව මගින්, සියලුම තැනැත්තන්ම නීතිය ඉදිරියේ සමාන බවත්, නීතියේ සම ආරක්ෂාවරණය ලැබීමට සියලු දෙනාටම මූලික අයිතියක් ඇති බවත් තහවුරු කර ඇත. යම් පැමිණිල්ලක් සම්බන්ධව අදාළ ක්‍රියා මාර්ග නොගැනීමක් හෝ පැහැර හැරීමක් හෝ මග හැරීමක් වේ නම් මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් පොලීසිය වගකීමට යටත්වනු ඇත.

(ආ) පොලීසියට ලැබෙන පැමිණිලි සම්බන්ධ විමර්ශන පක්ෂග්‍රාහී හෝ යම් පාර්ශවයකට අගතිගාමී නොවන ආකාරයෙන් ක්‍රියාත්මක කළ යුතුය. දේශපාලන බලපෑම් හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා මේ පිළිබද වූ පැහැර හැරීම් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝණයක් ලෙස සැලකෙයි.

(ඇ) පොලීසියේ මූලිකත්වය මත හෝ වෙනත් පාර්ශවයන්ගේ පෙළඹවීම මත පුද්ගලයන් වධහිංසා හෝ කෲර, අමානුෂික අවමන් සහගත සැළකිල්ලට හෝ නැතහොත් දඬුවමකට යටත් කිරීම් ඇතුළුව කිසිදු ආකාරයක හිංසනයකට පොලීසිය මහජනතාව භාජනය නොකළ යුතු ය.

(ඇ) වෛරී ප්‍රකාශන පිළිබඳව පොලීසිය නීති ප්‍රකාරව ක්‍රියා කළ යුතු වේ. ඒ පිළිබඳව 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය පනත හා දණ්ඩ නීති සංග්‍රහය, අනෙකුත් පනත් හා චක්‍රලේඛ කෙරෙහි නිසි අවධානය යොමු කළ යුතුය. ඒ හා සම්බන්ධව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිකුත් කළ මාර්ගෝපදේශ මේ සමග අමුණා ඇත.තවද මෙවැනි නීතිමය ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේදී ජනතාවගේ හෝ ඡන්ද අපේක්ෂකයින්ගේ හෝ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14(1) ප්‍රකාරව අදහස් ප්‍රකාශ කිරීමේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය නොවන ආකාරයෙන් කටයුතු කිරීමටද වගබලා ගත යුතුය.

(ඉ) මැතිවරණ ප්‍රචාරය හා සම්බන්ධ නීති සර්ව සාධාරණව සියලුම පුද්ගලයන් වෙනුවෙන් ක්‍රියාත්මක කළ යුතුය. සියලු දේශපාලන පක්ෂ අපේක්ෂකයන් හා ස්වාධීන අපේක්ෂකයන්ටද ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) ප්‍රකාරව සමානව සැළකිය යුතුය. එනම් "කිසියම් පුරවැසියෙකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂභාවය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය" යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට භාජනය නොවිය යුත්තේ ය. විශේෂයෙන් දේශපාලන මතය හේතුවෙන් අසමානව සැළකීම හෝ වෙනස්කොට සැළකීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමකි.

(ඊ) ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා අවශ්‍ය අවසර පත් ලබාදීමත්, මැතිවරණ රැස්වීම් පැවැත්වීමත්, පෙරහැර පැවැත්වීම සඳහා අවශ්‍ය අවසර පත් ලබාදීමත් අදාළ මැතිවරණ පනත් හා පොලිස් ආඥා පනත හා රෙගුලාසි ආදී නීති ප්‍රතිපාදන අනුව සිදුකළ යුතු වේ. එහිදී කිසිදු පාර්ශවයකට වැඩි වාසියක් හෝ අවාසියක් සිදුවන ආකාරයට එම බලතල ක්‍රියාත්මක නොකළ යුතු වේ. එසේ ක්‍රියාත්මක වන්නේ නම් පැහැදිලිවම එය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමක් වේ.

(උ) අත් පත්‍රිකා, පෝස්ටර්, අපේක්ෂකයන්ගේ ඡායාරූප, සංකේත, කොඩි සහ බැනර් ප්‍රදර්ශනය කිරීම මැතිවරණ නීතිය අනුව විය යුතුය. ඒවා ඉවත් කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම සම්බන්ධව යම්කිසි පක්ෂයකට හෝ යම් අපේක්ෂකයෙකුට විශේෂ සැළකිලි දැක්වීම ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමකි.

(ඌ) වෙනත් තැනැත්තෙකුගේ ඡන්දය භාවිතා කිරීමේ අයිතිය උල්ලංඝණය කරන පුද්ගලයන් සම්බන්ධයෙන් පොලීසිය දැඩිව නීතිය ක්‍රියාත්මක කළ යුතුය. මේ මාර්ග අනුගමනය නොකරන්නේ නම් ඉහත දැක්වූ පරිදි එය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 හා 14 (1) ව්‍යවස්ථා උල්ලංඝණය කිරීමකි.

(එ) ඡන්ද පොලවල් සහ සෙසු ස්ථාන සඳහා පොලිස් නිලධාරීන් ප්‍රමාණවත් ආරක්ෂාවක් ලබාදිය යුතු අතර, රටේ පවතින නීතීන් අනුගමනය කරමින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා සියළුම උත්සාහයන් දැරිය යුතු ය.

(ඒ) දේශපාලන පක්ෂ හෝ පුද්ගලයන් මැතිවරණ නීති උල්ලංඝණය කරයි නම් ඔවුන්ගේ පුද්ගල තත්වය හෝ දේශපාලන බලය නොතකා නීතිය ඔවුන් කෙරෙහි සමානව ක්‍රියාත්මක කළ යුතුය. රජයේ වාහන, ගොඩනැගිලි හා පරිශ්‍ර වැනි පොදු දේපලවලට හානි කරන හෝ අයුතු ලෙස

පරිහරණය කරන පුද්ගලයින්ට එරෙහිව දැඩි ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම පොලිස් නිලධාරියාගේ රාජකාරිමය වගකීම වන්නේ ය. එසේ නීතිය ක්‍රියාත්මක නො කිරීම ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමකි.

(ඔ) පශ්චාත් මැතිවරණ හිංසනයන් ඇතුළු මැතිවරණය හා සම්බන්ධ ප්‍රචණ්ඩත්වයන් වැළැක්වීම පොලිසිය සතු වගකීමකි. පසුගිය අත්දැකීම් අනුව දේශපාලන බලය මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝණය වන අන්දමේ මැතිවරණ හිංසනයන් සඳහා යොදා ගනු ලබන අවස්ථා වල පොලිසිය නීතියෙන් නියම කර ඇති විධිවිධානයන් ප්‍රකාරව නීතිය ක්‍රියාත්මක කිරීමත් මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීම් වැළැක්වීමට අවශ්‍ය සියළු පියවරයන් ගත යුතුය.

(ඕ) මැතිවරණ සමයේ සිදු කරන ප්‍රචාරන කටයුතු වලදී සහ පශ්චාත් මැතිවරණ සමයේ මැතිවරණ ජයග්‍රහණ සැමරීම සඳහා සිදුකරන කටයුතු වලින් මහජන පීඩාවක් සිදු නොවන ආකාරයෙන් ක්‍රියාත්මක වීමට අවශ්‍ය සියළු පියවර ගත යුතුය.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.
2024 ජූලි 31

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව